www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දෘෂබා ජෝති මජුම්දාර්: පුරෝගාමී ඉන්දියානු ට්‍රොට්ස්කිවාදියා මිය යයි

## Druba Jyoti Majumdar: pioneer Indian Trotskyist dies

**නන්ද වික්‍රමසිංහ සහ ගනේෂ් දේව් විසිනි**
**2005 ජනවාරි 27**

දෘෂබා ජෝති මජුම්දාර් නම් වූ පුරෝගාමී ඉන්දියානු ට්‍රොට්ස්කිවාදියා, ජනවාරි 16 වන ඉරිදා උදේ බටහිර බෙංගාලයේ කට්වා නගරයේ තම නිවසේ දී ඇදුම රෝගයෙන් මිය ගියේ ය. ඔහු 75 හැවිරිදි වී ය.

ඔහුගේ පවුලේ සාමාජිකයන් හා දේශපාලන සහෝදරවරුන් විසින් දූර්බෝ නමින් හඳුන්වනු ලැබූ මජුම්දාර්, 1946 දී 17 වන වියෙහි දී එවකට හතර වන ජාත්‍යන්තරයේ ඉන්දියානු උප-මහාද්වීපීය ශාඛාව වසයෙන් පැවති ඉන්දියානු බෝල්ෂෙවික් - ලෙනින්වාදී පක්ෂයට (බීඑල්පීඅයි) බැඳුනි. ඔහුගේ ජීවිතයේ මතු සම්පූර්න කාලය තුලදීම ඔහු තමා විප්ලවවාදී සමාජවාදියකු සහ ට්‍රොට්ස්කිවාදියකු ලෙස සලකා ගත්තේ ය. එහෙත් 1948 දී බීඑල්පීඅයි සංවිධානයේ ඉන්දියානු ඒකකය සුලුධනේශ්වර කොංග්‍රස් සමාජවාදී පක්ෂය තුලට දියකර හැරීම නිසා දශක ගනනාවක් තිස්සේ දූර්බෝගේ දේශපාලන වර්ධනය ඇනහිටවනු ලැබී ය.

දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව ධනවාදයේ ඇති වූ ප්‍රති ස්ථාවරත්වයේ බලපෑම මත හතර වන ජාත්‍යන්තරය තුල පැන නැගි විසකුරු අවස්ථාවාදී ප්‍රවනතාවක් වූ පැබ්ලෝවාදයට එරෙහිව හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් දශක ගනනාවක් තිස්සේ ගෙන යන ලද අරගලය ගැන 1990 ගනන් මුල වනතෙක්ම දූර්බෝ ද ඔහු ඇසුරු කලා වූ සහ බොහෝ සෙයින් බීඑල්පීඅයි සංවිධානයේ වියපත් පරිනතයින්ගෙන් සමන්විත වූ කොල්කතා (කල්කටා) සමාජවාදීන්ගේ කන්ඩායම දැන සිටියේ නැත. මයිකල් පැබ්ලෝ සහ අර්නස්ට් මැන්ඩෙල් විසින් නායකත්වය දෙනු ලැබූ මෙම ප්‍රවනතාව කියා පෑවේ, සෝවියට් ස්ටැලින්වාදී නිලධරයට, එහි ගැත්තර පක්ෂවලට, සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ට හා අධිරාජ්‍යවාදය විසින් පීඩනයට ලක් කෙරෙන රටවල ජාතික ධනේශ්වරයට ප්‍රගතිශීලි ක්‍රියාකලාපයක් පමනක් නොව විප්ලවවාදී ක්‍රියාකලාපයක් පවා ඉටු කිරීමට වෛෂයික බලවේග විසින් බල කෙරෙනු ඇති බව යි. එබැවින්, ට්‍රොට්ස්කිවාදීන්ගේ ක්‍රියාකලාපය වන්නේ මෙම සතුරු පන්ති බලවේගයන්ගෙන් කම්කරු පන්තියේ නායකත්වය දිනා ගැනීම නොව ඔවුන් වමට තල්ලු කිරීම යැයි පැවසිනි.

පැබ්ලෝගේ බලපෑම මත සිදු කලා වූ බීඑල්පීඅයි සංවිධානයේ දියකර හැරීම සම්බන්ධයෙන් ද දූන් එක්සත් ලේකම් මන්ඩලය යනුවෙන් හැඳින්වෙන පැබ්ලෝවාදීන්ගේ ජාත්‍යන්තර සංවිධානයෙහි සහායකයින් ලෙස කොල්කතා කන්ඩායමේ සාමාජිකයින් අනතුරුව අත්විඳි ඉතාමත්ම අප්‍රසන්න දේශපාලන අත්දැකීම් සම්බන්ධයෙන් ද මුලුමනින් ම නව එලියක් විහිදුවාලීමට පැබ්ලෝවාදය ගැන හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව කල විවේචනය සමත් විය. ජාත්‍යන්තර කමිටුවේ නියෝජිතයින් සමග කරන ලද දීර්ඝ සාකච්ඡාවලින් පසුව, දූර්බෝ, දුලාල් බෝස්, ගනේෂ් දත්තා, නිර්මාල් සමාජ්පති සහ දිනේශ් සන්යාල් ඇතුලු කල්කටා කන්ඩායම හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට දේශපාලන සහයෝගය දක්වන ඉන්දියානු සංවිධානය වන සෝෂලිස්ට් ලේබර් ලීගයට (එස්එල්එල්) බැඳුනි.

ස්ටැලින්වාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයේ (මාක්ස්වාදී) ප්‍රධාන බල කඳවුර වන බටහිර බෙංගාලය තුල එස්එල්එල් සංවිධානයේ වැඩකටයුතු වර්ධනය කිරීම සඳහා දුලාල් බෝස් සමග එකතුව දූර්බෝ ඉන්පසුව ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කලේ ය. ඇදුම රෝගයෙන් බරපතල ලෙස පීඩා විඳි නමුත් ඔහු එස්එල්එල් සංවිධානයේ බෙංගාලි පුවත් පත වන *අන්තර්ජාතික් ශ්‍රමික්* (ජාත්‍යන්තර කම්කරුවා) පත්‍රයට ද එහි පූර්වගාමියා වූ *ශ්‍රමිකර් පාත්* (කම්කරු මාවත) පුවත් පතට ද බොහෝ ලිපි සැපයීය. කට්වා සහ කොල්කතා නගරවල පැවැත් වූ එස්එල්එල් ප්‍රසිද්ධ රැස්වීම් අමතා කථා කලේ ය. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* පල වූ ලිපි බෙංගාලි බසට පරිවර්තනය කලේ ය. ඩේවිඩ් නෝර්ත්ගේ *අප රක්නා උරුමය: හතර වන ජාත්‍යන්තරයේ ඉතිහාසයට ප්‍රතිප්‍රදානයක්* යන කෘතිය බෙංගාලි භාෂාවෙන් පලකිරීමේ කටයුතු සඳහා සහභාගි විය.

කට්වා විද්‍යාලයේ දර්ශනය පිලිබඳ මහාචාර්යවරයකු වූ දූර්බෝට තියුනු මනසක් සහ පුලුල් බුද්ධිමය උනන්දුවක් පැවතුනි. ඔහු මාක්ස්වාදී සම්භාව්‍ය ග්‍රන්ථ මෙන්ම පුරාතන හා නවීන ඉන්දියානු දර්ශනය ද හදාරා

තිබින. බෙංගාලි, හින්දි සහ ඉංග්‍රීසි භාෂා ගැන හසල දැනුමක් ඇතිව සිටි ඔහු ආධුනික වාග්විද්‍යාඥයෙක් විය. ඉන්දියාවේ වෙනත් ප්‍රදේශවලින් හෝ විදේශයන්ගෙන් තමා හමුවීමට සහෝදරවරුන් පැමිනි විට ඔහු, බෙංගාලි හා සිංහල භාෂාවන් ඇතුලු නොයෙකුත් භාෂාවන්හි වදන් අතර සබඳතා ගැන සාකච්ඡා කිරීමට ද ඒවා ගවේෂනය කිරීමට ද ආශා කලේ ය.

මනෝ විද්‍යාව ගැන ගැඹුරු අධ්‍යයනයක් කල දූර්බෝ මනබ්මන් (මිනිස් මනස) යන බෙංගාලි සඟරාවට ලියූ ලිපි සහ 2003-04 කාලය තුල පලකෙරුනු වෙලුම් දෙකකින් යුත් මනබික් චේතනාර් ස්වරූප් සන්ධානේ (මානව විඥානය ගැන ගවේෂනයක්) යන කෘතිය තුල දී භෞතිකවාදී ඉදිරිදර්ශනයක් මත මනෝ විද්‍යාත්මක ගැටලු විග්‍රහ කිරීමේ ප්‍රයත්නයක යෙදුනේ ය. ඔහුගේ English-Bengali Dictionary of Abnormal Psychology and Psychopathology (අවප්‍රමාන මනෝවිද්‍යාව සහ මනෝව්‍යාධි විද්‍යාව පිලිබඳ ඉංග්‍රීසි-බෙංගාලි ශබ්දකෝෂය) යන පුරෝගාමී කෘතිය බටහිර බෙංගාල ආන්ඩුව විසින් පල කරන ලදි.

තම ජීවිතයේ අග දක්වාම දූර්බෝ තරුන ජවයකින් යුක්ත විය. ඇදුම රෝගය නිසා ඔහුට දුර ගමන්වල යෙදීම ඉතාමත් වෙහෙසකර වූවත් ඔහු සෝෂලිස්ට් ලේබර් ලීගයේ වැඩකටයුතුවලට ප්‍රතිපදානයන් කිරීමට ඉතාමත් ම කැමැත්තෙන් සිටියේ ය. තම සහෝදරවරුන්ගේ සෞඛ්‍යය සහ හිතසුව ගැන ඔහු දැක්වූ උත්සුකතාව, ඔහුගේ ත්‍යාගශීලිබවට ද විප්ලවවාදී කේඩර් මත පැටවෙන වගකීම් හා ඔවුන්ගේ තීරනාත්මක වැදගත්කම ගැන ඔහුට තිබූ වැටහීමට ද දෙස් දෙන්නකි.

### දූර්බෝ සහ බීඑල්පීඅයි සංවිධානය

1929 මාර්තු 3 වැනි දා දූර්බෝ උපත ලැබූයේ වර්තමාන බංග්ලාදේශයේ රංග්පූර් දිස්ත්‍රික්කයේ බාප්නා නම් නගරයේ දී ය. වරප්‍රසාදිත බ්‍රාහ්මන පවුලක උපත ලද ඔහු දරුවන් පස්දෙනෙකුගෙන් දෙවැනියා විය. ඔහුගේ පියා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී පාලකයන් යටතේ යුක්තිය පසිඳලීමේ යෙදුනු උප මහේස්ත්‍රාත් වරයෙක් විය.

ඉන්දියාවේ දුවැන්ත අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයේ ද වැඩෙන කම්කරු පන්තික අරගලවල ද ෆැසිස්ට්වාදයේ, ලෝක යුද්ධයේ සහ 1943-44 දී බ්‍රිතාන්‍යයන් විසින් අවුලුවන ලද බෙංගාල දුර්භික්ෂයේ භයංකරත්වයේ ද බලපෑම යටතේ දූර්බෝ තම හැදියාවට එරෙහිව කැරලි ගැසුවේ ය. එවකට වයස 13 සිටි ඔහු, 1942 අගෝස්තුවේ දී ජ්‍යේෂ්ඨ කොංග්‍රස් නායකයින් අත්අඩංගුවට ගැනීමෙන් පසුව පිපිරුනු ස්වයංසිද්ධ දේශ ව්‍යාප්ත කැරැල්ලක් වූ ''ක්විට් ඉන්දියා'' (ඉන්දියාවෙන් පිටවෙනු) ව්‍යාපාරයට සහභාගි විය.

මේ කාලයේ දී දූර්බෝ, බ්‍රාහ්මන පිරිමියාගේ ආගමික වතාවත් සහ කුල ගර්වයේ සංකේතයක් වූ පූනනූල ගලවා දැම්මේ ය. පසු කලෙක ඔහු යෝජිත විවාහ පිලිබඳ ඉන්දියානු සම්ප්‍රදාය කඩා බිඳ දැම්මේ ය.

දූර්බෝට ප්‍රථම වතාවට බීඑල්පීඅයි සංවිධානය හමුවූයේ 1947 දී කල්කටාවේ දී ය. එකල ඔහු එහි ප්‍රෙසිඩන්සි විද්‍යාලයෙහි ආර්ථික විද්‍යාව හැදෑරීමෙහි යෙදී සිටියේ ය. දෙවැනි ලෝක යුද්ධයේ අවසානය සහ බ්‍රිතාන්‍යයේ ඉන්දියානු අධිරාජ්‍යය දියකර හැරීම අතර වසර දෙක, වැඩවර්ජන, ගොවි ජන කැරලි, කුමාර රාජ්‍යවල වැඩවසම් විරෝධී ව්‍යාපාර සහ සුභාස් චන්ද්‍ර බෝස්ගේ ඉන්දියානු ජාතික හමුදාවේ සාමාජිකයන් සිරගත කිරීමට එරෙහි මහජන පෙලපාලි ආදියෙන් සමන්විත වූ වර්ධනය වන විප්ලවවාදී ස්වභාවයේ දුවැන්ත අරගලවලින් පිරී ගියේ ය. 1947 අගෝස්තුවේ දී ඉන්දියාව හා බෙංගාලය ජාතිභේදවාදී පදනමක් මත බෙදා වෙන් කරනු ලැබීමට නියමිත වූ නමුත් මෙම අරගල හින්දූන්, මුස්ලිමුන්, සික්වරු සහ ක්‍රිස්තියානුන් නො වලහා එක්සත් කලේ ය.

මේ අවස්ථාව වන විට දූර්බෝ, තම අධ්‍යයනයන්ගේ මෙන් ම සිද්ධීන් පිලිබඳ හැදෑරීමේ ප්‍රතිඵලයක් ලෙස, මාක්ස්වාදියෙක් වීමට තීන්දු කර තිබුනි. ඉන්දියානු ජාතික කොංග්‍රසයේ ධනේශ්වර ස්වභාවය ඔහු මැනවින් හඳුනාගත්තේ ය. ගාන්ධිගේ නායකත්වය යටතේ කොංග්‍රසය, කම්කරු පන්තියේ කිසිදු ස්වාධීන ක්‍රියාවකට හෝ ධනේශ්වර දේපලවලට අභියෝගයක් ඇතිවීමට හෝ දැඩි ලෙස විරුද්ධ වන අතරම, රාජ්‍ය යන්ත්‍රනය මත පාලනය අතහරින ලෙස ඉන්දියාවේ විජිත හාම්පුතුන්ට බල කිරීම සඳහා, පාලනය කරන ලද මහජන බලමුලු ගැන්වීම් මෙහෙයවී ය.

දූර්බෝ ස්ටැලින්වාදී ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය ගැන ද වැටහීමක් ලබාගෙන සිටියේ ය. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය, සෝවියට් සංගමය ආරක්ෂා කිරීමේ නාමයෙන්, 1942 ආරම්භයේ සිට දෙවැනි ලෝක යුද්ධයේ අවසානය දක්වා බ්‍රිතාන්‍ය විජිත පාලන තන්ත්‍රය සමග විවෘතව ම සන්ධාන ගත වූ අතර, ''ක්විට් ඉන්දියා'' නැගිටීම හෙලා දකිමින් එයට විරුද්ධව උද්ඝෝෂනය ද කලේ ය. අර්ධ නැගිටීම් ලක්ෂන රැගත් 1945-47 අරගල තුල දී, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය, තම ''වගකීම්'' හඳුනාගෙන බ්‍රිතාන්‍ය විරෝධී එක්සත් ජාතික පෙරමුනකට නායකත්වය දීමට එක්වන ලෙස, එකිනෙකාට එරෙහිව පිහි අමෝරා සිටි, කොංග්‍රසයට සහ මුස්ලිම් ලීගයට බලකරන්නැයි කම්කරුවන්ගෙන් ඉල්ලමින් කම්කරු පන්තිය ජාතික ධනේශ්වරයේ ප්‍රතිවාදී කන්ඩායම්වලට යටත් කිරීමට පියවර ගත්තේ ය.

1940 ගනන්වල මැදභාගයේ යම් කාල පරිච්ඡේදයක් තුල, දූර්බෝ ''ක්විට් ඉන්දියා'' කැරැල්ලේ දී නායක ක්‍රියා කලාපයක් ඉටු කල කොංග්‍රස් සෝෂලිස්ට් පක්ෂයේ (සීඑස්පී) අනුගාමිකයෙක් ලෙස තමාව සලකා

ගත්තේ ය. කොංග්‍රසයේ කන්ඩායමක් වූ සීඑස්පීය පේබියන්වාදය සහ මාක්ස්වාදය සමග ගාන්ධිවාදය සංකලනය කිරීමට උත්සාහ කලේ ය. 1947 වන විට, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග, විජිත රාජ්‍ය යන්ත්‍රයේ පාලනය කොංග්‍රසය අතට ගැනීමට ඉඩ සලසන සම්මුතියක් ඇති කර ගැනීමට කොංග්‍රස් නායකයින් දරන ප්‍රයත්නය ඉදිරියේ සීඑස්පීය යටත්වීම හේතු කොටගෙන දුර්බෝ අර්බුදයට ගියේ ය.

කොංග්‍රසයට ද සීඑස්පීයේ රැඩිකල් ජාතිකවාදීන්ට ද ස්ටැලින්වාදීන්ට ද එරෙහිව විප්ලවවාදී ඉදිරිදර්ශනයක් ඉදිරිපත් කලේ බීඑල්පීඅයි සංවිධානය පමනකි.

ලංකා සමසමාජ පක්ෂයේ (ලසසප) ආරම්භකත්වයෙන් 1942 දී පිහිටුවනු ලැබූ බීඑල්පීඅයි සංවිධානය බ්‍රිතාන්‍ය හා කුමාර ඉන්දියාවේ ද ලංකාවේ ද සියලුම ප්‍රදේශවල ට්‍රොට්ස්කිවාදීන් එක්සත් කලේ ය.

සමස්ත ඉන්දියානු විප්ලවවාදී කම්කරු පන්තික පක්ෂයක් වර්ධනය කිරීම, සමසමාජ පක්ෂය හතර වන ජාත්‍යන්තරයට දැක්වූ පක්ෂපාතිත්වයෙන් ද නොනවතින විප්ලවයේ ක්‍රියාමාර්ගය වර්ධනය කිරීමට ගත් උත්සාහයෙන් ද ගලා ආ මූලෝපායක් විය. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ කර්තව්‍යයන් සාක්ෂාත් කෙරෙන්නේ, දකුනු ආසියාව පුරා කම්කරු පන්තිය බ්‍රිතාන්‍ය විජිත පාලනයට එරෙහි අරගලයේ නායකත්වය ධනේශ්වරය අතින් තමන් වෙතට උදුරා ගෙන, ගොවි ජනතාව ඉඩම් හිමියන්ට විරුද්ධව විප්ලවවාදී ක්‍රියාමාර්ගයක් මත මෙහෙයවමින්, අධිරාජ්‍ය විරෝධී අරගලය ලෝක කම්කරු පන්තියේ සමාජවාදී අරගලයේ අත්‍යන්ත කොටසක් බවට පත් කල හොත් පමනක් යැයි බීඑල්පීඅයි සංවිධානය තම ආරම්භක ලියවිලිවල අවධාරනය කලේ ය.

මෙම ඉදිරිදර්ශනය බලවත් සහායක් දිනාගත්තේ කල්කටාවේ ද (කොල්කතා) බොම්බායේ ද (මුම්බායි) මදුරාසියේ ද (චෙන්නායි) ප්‍රධාන කම්කරු පන්තික අරගලවල නායකත්වය ලෙස බීඑල්පීඅයි සංවිධානය ඉස්මතු වෙමිනි. 1946 පෙබරවාරියේ දී රාජකීය ඉන්දියානු නාවික හමුදාවේ (ආර්අයිඑන්) නාවිකයන් දියත් කල කැරැල්ලට සහාය පිනිස වැඩවර්ජනය කිරීමට හා බැරිකේඩ් දැමීමට බොම්බායේ කම්කරුවන් බලමුලුගැන්වීමෙහි ලා එය ඉටු කල ප්‍රධාන ක්‍රියාකලාපය හේතු කොටගෙන බීඑල්පීඅයි සංවිධානය පුවත් පත්වල හෙලා දැකීමට ලක් විය. අවසානයේ දී, බ්‍රිතාන්‍ය හමුදාවන්ගේ ද කැරලි ගැසූ නාවිකයන් යටත් විය යුතු යැයි කොංග්‍රසයේ හා මුස්ලිම් ලීගයේ නායකයින් ඉදිරිපත් කල ඉල්ලීමේ ද ඒකාබද්ධ ක්‍රියාකලාපයේ ප්‍රතිඵලයක් ලෙස ආර්අයිඑන් කැරැල්ල බිඳ දමන ලදි.

නැගී එන කම්කරු-ගොවි අරගල රැල්ල සහ බ්‍රිතාන්‍ය ඉන්දියානු සන්නද්ධ හමුදා මත එයින් ඇති කෙරෙන බලපෑම, බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය සමග ඉක්මන් සම්මුතියකට ඒමෙහි ලා කොංග්‍රසය වඩාත් මංමුලා සහගත වීමට හේතු විය.

## පැබ්ලෝවාදී අවස්ථාවාදයේ විනාශකාරී බලපෑම

1947-48 කාල පරිච්ඡේදය තුල දී, දුර්බෝ බීඑල්පීඅයි සංවිධානයෙහි තරුන ව්‍යාපාරයේ නායකයෙකු ලෙස ඉස්මතු වෙද්දී, එම පක්ෂය දැවැන්ත තත්කාලීන වැදගත්කමක් රැගත් අධිෂ්ඨානවත් වූත් ප්‍රතිපත්තිමය වූත් ස්ථාවරයක් ගත්තේ ය. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය විසින් ජාතික ධනේශ්වරයට දේශපාලන බලය මාරු කිරීමට ද දකුනු ආසියාව තුල, උපතේ සිටම ජනවාර්ගික භේදයක් මූර්තිමත් කලා වූත් ඒවා පෝෂනය කලා වූත් ''ස්වාධීන'' ධනේශ්වර රාජ්‍ය තුනක් බෙදා වෙන් කිරීමට ද බීඑල්පීඅයි සංවිධානය විරුද්ධත්වය ප්‍රකාශ කලේ ය. බ්‍රිතාන්‍ය ඉන්දියාව ලේවැකි ගැටුමක් තුලින් මුස්ලිම් පකිස්ථානයකට ද හින්දු ඉන්දියාවකට ද බෙදා වෙන් කිරීම කොංග්‍රසයේ හා මුස්ලිම් ලීගයේ අධීක්ෂනය යටතේ සිදු කරන ලද අතර, ශ්‍රී ලාංකික ධනේශ්වරය, අහම්බයක් නො වන පරිදි, දිවයිනේ කම්කරු පන්තියේ ඉතාම බලවත් කොටස වූ ''ඉන්දියානු'' දෙමල වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිය අහිමි කිරීම මගින් තම නව රාජ්‍යය බෞතීස්ම කලහ.

එහෙත් මෙම විග්‍රහය ගැඹුරු කරමින්, ජාතික ධනේශ්වරය විසින් අධිරාජ්‍ය විරෝධී අරගලය ගබ්සා කරනු ලැබීමේ මූලික පාඩම් දකුනු ආසියානු හා ලෝක කම්කරු පන්තිය සඳහා උකහා ගැනීම වෙනුවට, බීඑල්පීඅයි සංවිධානයෙහි ඉන්දියානු ඒකකය, දුර්බෝ සහභාගි වූ ප්‍රථම පක්ෂ සම්මේලනය වූ, 1948 සම්මේලනය යෙදවූයේ, සිය සංවිධානය කොංග්‍රස් සෝෂලිස්ට් පක්ෂය තුලට දිය කර හැරිය යුතු ද නැද්ද යන්න ගැන විවාද කිරීමට ය.

අධිරාජ්‍ය විරෝධී මහජන ව්‍යාපාරයේ රැල පහර බැස යාම ද කොංග්‍රසය සහ දකුනු ආසියාවේ නව දේශපාලන පර්යාය ගැන තිබූ ජනතා මිථ්‍යාවන් ද, බීඑල්පීඅයි සංවිධානය විසුරුවා හැරීමට තුඩු දුන් දේශපාලන ව්‍යාකූලත්වයේ සහ අවමංගතවීමේ බලවත් සාධක වූ බව නිසැක ය. එහෙත් බීඑල්පීඅයි සංවිධානය දියකර හැරීමේ යෝජනාව, වසර ගනනක් තිස්සේ, බීඑල්පීඅයි නායකයන් හා සාමාජිකයන් බහුතරයකගේ ප්‍රතිරෝධයට ලක්ව තිබුනි. බීඑල්පීඅයි සංවිධානය දේශපාලන වසයෙන් නිරායුධ කිරීමේ දී තීරනාත්මක වුයේ, ඒකාබද්ධ ලෝක විප්ලවවාදී මූලෝපායයක් දෙන ලද රටක එම අවස්ථාවේ දී කම්කරු පන්තික ව්‍යාපාරය තුල ආධිපත්‍යය දරන්නා වූ ඕනෑම බලවේගයක් කරා ජාතික-උපක්‍රමික හැඩගැස්මක් මගින් විස්ථාපනය කෙරුනු, පැබ්ලෝ සහ මැන්ඩෙල් වර්ධනය කල, අවස්ථාවාදී දේශපාලන ඉදිරිදර්ශනය යි.

බීඑල්පීඅයි සංවිධානය දියකර හැරීම දකුනු ආසියාව තුල හතර වන ජාත්‍යන්තරයේ වර්ධනය සම්බන්ධයෙන්

විනාශකාරී බලපෑමක් ඇති කලේ ය. ඉන්දියාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය, ප්‍රායෝගික අර්ථයෙන් ගත් කල, දියකර හරින ලදි. ලංකාව තුල පැබ්ලෝ සිදු කලේ, 1942 දී බීඑල්පීඅයි පිහිටුවීමට විරුද්ධ වූත් තම සංවිධානය සඳහා ලසසප නම සොරා ගත්තා වූත් 1948 ලංකාවේ ස්වාධීනතා ගිවිසුමට පක්ෂව ඡන්දය දුන්නා වූත් භ්‍රෂ්ට කන්ඩායමක් සමග බීඑල්පීඅයි සංවිධානය ඒකාබද්ධ කිරීමට අනුබල දීම යි. බීඑල්පීඅයි සංවිධානය ප්‍රතිවාදී ලසසපය සමග එක්සත් වීම, 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නායකත්වය දුන් ධනේශ්වර සභාග ආන්ඩුවකට එක් වී ධනේශ්වර පද්ධතියේ කොටසක් බවට පත්වීමෙන් කුලු ගැන්වුනු ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ මාධ්‍යමිකවාදී පල්ලම් බැසීමේ ප්‍රධාන පියවරක් විය.

දූර්බෝ, බීඑල්පීඅයි සංවිධානය විසුරුවා හැරීමට තදින් විරුද්ධ වූ, දුලාල් බෝස්ගේ ප්‍රධාන නායකත්වයෙන් යුක්ත, බටහිර බෙංගාලයේ කන්ඩායමක සාමාජිකයෙක් විය. ජය ප්‍රකාශ් නාරායන්ගේ සහ අශෝක් මේතාගේ කොංග්‍රස් සෝෂලිස්ට් පක්ෂයට එකතුවීමෙන් ට්‍රොට්ස්කිවාදීන් ''කම්කරු පන්තියට සමීප කරවන'' බව කියා පෑ අයට ඔවුන් පිලිතුරු දුන්නේ, කොංග්‍රස් පක්ෂය අධිරාජ්‍ය විරෝධී අරගලය පාවාදීමේ දී කොංග්‍රස් සෝෂලිස්ට් පක්ෂය එහි වාමාංශය ලෙස ක්‍රියා කල බව ද එය වෘත්තීය සමිති ක්‍රියාධරයන්ගේ සහ රැඩිකලීකරනය වූ මධ්‍යම පන්තික කොටස්වල පක්ෂයක් බව ද එය මැතිවරනවලට යොමු වූ පක්ෂයක් බවට වේගයෙන් කුනු වෙමින් පවතින බව ද පෙන්වා දෙමිනි.

බීඑල්පීඅයි දියකර හැරීමට විරුද්ධ වූ දූර්බෝ සහ බටහිර බෙංගාලයේ අනෙක් අය, අනතුරුව, කලින් බීඑල්පීඅයි සංවිධානයේ බෙංගාලි පුවත් පත වූ ඉන්කිලාබ් (විප්ලවය) වටා කන්ඩායමක් ලෙස සංවිධානය වූහ. එහෙත් 1953 දී පැබලෝවාදී අවස්ථාවාදයේ විරුද්ධවාදීන් ජාත්‍යන්තර කමිටුව පිහිටුවීම කරා වර්ධනය වූ හතර වන ජාත්‍යන්තරය තුල සිදු වූ අරගලයෙන් ඔවුන් වෙන් කරනු ලැබ සිටියහ. මේ නිසා, බීඑල්පීඅයි සංවිධානය දියකර හැරීමට තුඩු දුන් අවස්ථාවාදයේ සමාජ මූලයන් තහවුරු කර ගැනීමට හෝ මහජන ව්‍යාපාරය තුලට ඒකාග්‍ර වීමේ අවශ්‍යතාව ගැන පැබ්ලෝවාදීන් කල දේශනාවන් ප්‍රතික්ෂේප කිරීමේ දී කල යුතුව තිබුනු විප්ලවවාදී නායකත්වයේ ක්‍රියාකලාපය සහ කම්කරු පන්තියට එහි තිබූ සම්බන්ධතාව පිලිබඳ ප්‍රධාන ගැටලු පැහැදිලි කර ගැනීමට හෝ ඔවුහු අසමත් වූහ.

පැබ්ලෝවාදයට හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ විරුද්ධත්වය ගැන ඉන්දියානු ට්‍රොට්ස්කිවාදීන් දැනුවත්ව නො සිටීම සම්බන්ධයෙන් වැඩි වගකීමක් දැරිය යුත්තේ ආසියාවේ විශාලතම සහ දේශපාලන වසයෙන් බෙහෙවින් විභාගයට ලක් වූ ට්‍රොට්ස්කිවාදී පක්ෂය වූ ලංකා සමසමාජ පක්ෂයේ නායකත්වය යි. පැබ්ලෝගේ අවස්ථාවාදී ප්‍රවාදයන් බොහොමයකට ම, විශේෂයෙන් ම සෝවියට් ස්ටැලින්වාදී නිලධරයේ විප්ලවවාදී ශක්‍යතාව පිලිබඳ ස්ථාවරයට, ලසසප නායකයෝ විරුද්ධ වූහ. එහෙත් ජාත්‍යන්තර කමිටුව විසින් හතර වන ජාත්‍යන්තරය දේශපාලන වසයෙන් යලි සන්නද්ධ කිරීම වඩවඩාත් පැහැදිලිව ප්‍රදර්ශනය වෙමින් තිබූ ඔවුන්ගේ පාර්ලිමේන්තුවාදී සහ වෘත්තීය සමිතිවාදී හැඩගැස්වීම අවුල් කර දමනු ඇතැයි බිය වූ එම නායකයෝ, අව්‍යාජ ට්‍රොට්ස්කිවාදීන් වෙනම සංවිධානයක් තුල රැලිවීමේ තීන්දුවට විරුද්ධ වූහ.

1990 ගනන් මුල දී ජාත්‍යන්තර කමිටුව වටා එක් වූ දූර්බෝ සහ අනෙක් බීඑල්පීඅයි සහෝදරවරු බීඑල්පීඅයි දියකර හැරීමෙන් පසුව ගත වූ දශක සතර සැමවිටම මතකයට නැංවූයේ අප්‍රියාවෙන් සහ ලජ්ජාවෙනි. 1954 දී ඉන්කිලාබ් කන්ඩායම පැබ්ලෝවාදී ජාත්‍යන්තරයේ ඉන්දියානු ශාඛාව වන කොමියුනිස්ට් ලීගය සමග එක් විය. පැබ්ලෝවාදී බලපෑම මත දූර්බෝ සහ ඔහුගේ අන් සහෝදරවරු, කම්කරු පන්තිය මුහුන දෙන මූලික දේශපාලන ගැටලු පැහැදිලි කිරීම නොව ආනුභාවය දිනා ගැනීමේ උපායික උපාමාරු ගැන වඩවඩා උනන්දු වූහ.

1960 ගනන් මැද දී ඉන්කිලාබ් කන්ඩායම ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාක්ස්වාදී) හෙවත් සීපීඑම් සංවිධානයට ඇතුලු වීමට උත්සාහ කලේ ය. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයෙන් (සීපීඅයි) කැඩුනු කන්ඩායමක් වූ සීපීඑම්, කොංග්‍රස් පක්ෂයට ආවැඩීමේ සීපීඅයි පිලිවෙත හෙලා දකිමින්, සෝවියට් නායකත්වය පිලිබඳව චීන ආන්ඩුව කල විවේචන සමහරක් පුනරුච්චාරනය කල නමුත් අවධි දෙකේ විප්ලවය පිලිබඳ න්‍යාය සහ තනිරටේ සමාජවාදයේ සිට මොස්කව් අවනඩු දක්වා ස්ටැලින්වාදයේ සමස්ත සම්ප්‍රදාය ම ආරක්ෂා කලේ ය.

''ප්‍රතිවිප්ලවවාදී ට්‍රොට්ස්කිවාදීන්ට'' තම පක්ෂයට ඇතුලුවීමට ඉඩදීම සීපීඑම් නායකත්වය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් පසුව දූර්බෝ තනිව සීපීඑම් සංවිධානයට බැඳුනි. කෙසේ වෙතත් සීපීඑම් සංවිධානය, මාවෝවාදී-නක්සල්වාදී කැරැල්ල මර්දනය කිරීම සඳහා ධනේශ්වර රාජ්‍යය සමග අත්වැල් බැඳගත් විට දූර්බෝ එයින් වැඩි කල් නොගොස් ඉවත් විය.

## දේශපාලන පුනර්ජීවනය

එස්එල්එල් සහ ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ නියෝජිතයින් අමතා දූර්බෝ මෙසේ ප්‍රකාශ කිරීමට කැමති විය: ''දේශපාලන අර්ථයෙන් ගත් කල, ඔබ සහ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ අනෙක් සහෝදරවරු මුන ගැසීමෙන් පසුව මම නැවත ඉපදුනා. ප්‍රශ්න විස්තර කිරීමට, සාකච්ඡා කිරීමට සහ පැහැදිලි කිරීමට ජාත්‍යන්තර කමිටුවේ තරුන සහෝදරවරු ගත් දෘඪ සහ ඉවසිලි සහගත ප්‍රයත්නයන් නිසා කලින් පරම්පරාවකට අයත් වූ මට

සහ අනෙකුත් බීඑල්පීඅයි සහෝදරවරුන්ට, දශක හතරකට කිට්ටු කාලයක් තිස්සේ පැබ්ලෝවාදී දියකරහැරීම්වාදය මගින් අපව තල්ලු කර දමා තිබුනු ව්‍යාකූලත්වයෙන් අපේක්ෂා භංගත්වයෙන් සහ කලකිරීමෙන් මිදීමට හැකි වුනා. අපට දැන් දැනෙන්නේ අප යලිත් පැරනි අභිමානවත් බීඑල්පීඅයි කාලයේ සහ ට්‍රොට්ස්කිගේ හතර වන ජාත්‍යන්තරයේ සිටින බව යි. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට සහ එහි නායකත්වයට ස්තුති වන්නට අපි අද සන්තෝෂයෙන්, පැහැදිලි චින්තනයකින් සහ අපගේ ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අනාගතය ගැන විශ්වාසයකින් යුක්තව සිටිමු. අන්තිමේ දී මෙම දශක ගනනාවක කාල පරිච්ඡේදයෙන් පසුව අපි අපගේ ට්‍රොට්ස්කිවාදී ඒත්තුගැනීම් සමග සුසංයෝගීව සිටිමු.''

දේශපාලනන ව්‍යාකූලත්වයේ සහ හුදකලාවේ දීර්ඝ කාලයක් ජීවත් වීම දූර්බෝගේ ශරීර සෞඛ්‍යය පිරිහීමට බෙහෙවින් බලපෑවේ ය. යම්කිසි විධියකින් ලෙහෙසි මාවතේ යෑමට ඔහුට යම් හෝ අවශ්‍යතාවක් තිබුනේ නම්, 1977 පටන් ප්‍රාන්ත ආන්ඩුවට නායකත්වය දෙන බටහිර බෙංගාලයේ ස්ටැලින්වාදීන්, ඔහුගේ දේශපාලන අතීතය සහ බුද්ධිමය ධෛර්‍යය තමන්ට යම් ප්‍රභාවක් ලබාදෙනු ඇතැයි විශ්වාස කරමින් ඔහුට සිය තන්ත්‍රය තුල තැනක් ලබාදීමට ඉඩ තිබුනි. එහෙත් එවැනි පුරාජේරු වැඩ දූර්බෝට අවශ්‍ය වූයේ නැත. 1965 දී ඔහු බටහිර බෙංගාලයේ විද්‍යාල ආචාර්ය සංගමයේ ප්‍රධාන ලේකම් ධුරයට තේරී පත් විය. එහෙත් සංගමයේ ස්ටැලින්වාදී නායකත්වයට ඔහුගේ ඇති විරුද්ධත්වය නිසා, ඊලග වසරේ ද සංගමයේ නිලවරනයට තරග කිරීමට කල ඉල්ලීම කෙලින්ම ප්‍රතික්ෂේප කල ඔහු ඒ වෙනුවට සංගමයෙන් ඉල්ලා අස් විය.

ඔහුගේ දේශපාලන දෘඪතර භාවය නිසා තම සේවා ස්ථානයේ දී ද ශාස්ත්‍රීය කවයන්හි දී ද ස්ටැලින්වාදීන් විසින් දූර්බෝව කොන් කරන ලදි. නක්සල්වාදීන්ට සහාය දෙන්නේ ය යන චෝදනා මත ඔහු පොලිස් නිරීක්ෂනයන්ට යටත් කෙරුනු අතර ඔහුගේ නිවසට සන්නද්ධ කොමාන්ඩෝවරු කඩා පැන්නාහ. සත්‍යය වූයේ මාවෝවාදයට ආකර්ශනය වූ ශිෂ්‍යයින් සමග කල සාකච්ඡාවල දී පුද්ගල ත්‍රස්තවාදය පිලිබඳ නක්සල්වාදීන්ගේ න්‍යායයන්ට ද ''පන්තිමය සමූල ඝාතනය'' එනම් ප්‍රාදේශීය ඉඩම් හිමියන් ඝාතනය කිරීම සඳහා ඔවුන් කල ඇඟ හිරිවැටෙන කැවඳවුම්වලට ද දූර්බෝ දැඩි සේ විරුද්ධ වූ බව යි. එහෙත් රාජ්‍යය විසින් නක්සල්වාදීන්ව අනුකම්පා විරහිතව මර්දනය කිරීමට විරුද්ධව ඔහු බලවත් සේ තම අදහස් ප්‍රකාශ කල අතර ඒ හේතු කොටගෙන ඔහු ද ඔහුගේ පවුලේ සාමාජිකයෝ ද දීර්ඝ කාලයක් පොලිස් හිරිහැරයන්ට ලක්වූහ.

එස්එල්එල්හි සහ ශ්‍රී ලාංකික සසපයේ නියෝජිතයින් මුන ගැසෙන කාලය වන විට ශාරීරික සහ මානසික කම්කටොලු හා පීඩනයන් නිසා දූර්බෝ බෙහෙවින් අකර්මන්‍ය තත්වයක සිටියේ ය. ඔහුගේ ඇදුම පාලනය කිරීමට ඔහුට ස්ටෙරොයිඩ්ස් ඇතුලුව ඖෂධ මාලාවක පිහිට පැතීමට සිදුව පැවතින. ඔහුට ගමන්බිමන්වල යෙදිය හැකි වූයේ ඉතා මඳ වසයෙන් පමනක් වූ අතර දුවිල්ල සහ පරිසර දූෂනය නිසා කල්කටාවට යාම වෙහෙසකර විය.

එහෙත් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව සමග ඔහුගේ ඇසුර නිසා දූර්බෝ පුනර්ජීවනයකට ලක් විය. ඔහු හතර වන ජාත්‍යන්තරයට නැවත ඇතුලු වීම, සෝවියට් නිලධරය විසින් අධිරාජ්‍යවාදයට පුදන ලද අවසාන සේවය වූ සෝවියට් සංගමය බිඳ විසුරුවීම ද චීන ස්ටැලින්වාදී නිලධරය ධනපති පුනස්ථාපනයට විවෘතවම හැරීම ද ධනේශ්වරයේ නව-ලිබරල් ආර්ථික ප්‍රතිසංස්කරන වැඩපිලිවෙල ඉන්දියානු ස්ටැලින්වාදීන් විසින් වැලඳ ගැනීම ද සමග සම්පාත විය. සෑම මට්ටමකින් ම ස්ටැලින්වාදී සීපීඑම් සමග යුද වැදීමට දූර්බෝ උනන්දුවෙන් සිටියේ ය.

එක් සාකච්ඡාවක දී ඔහු මෙසේ අදහස් දක්වී ය. ''ස්ටැලින්වාදී ව්‍යාපාරය වටා සිටින බොහෝ දෙනෙක් ස්ටැලින්වාදී පක්ෂයේ දේශපාලනයට තමන්ගේ සහාය යුක්ති සහගත කිරීමට උත්සාහ කරන්නේ, කම්කරු පන්තිය විප්ලවවාදී දේශපාලනයේ යෙදීමට තරම් මෝරා නැති බව පවසමිනි. එහෙත් ඔවුහු එක් තීරනාත්මක කරුනක් යට ගසතිඃ එනම් මෙම නුසුදානම ස්ටැලින්වාදී පක්ෂයේ සහ ඊට ආවරනය සැපයූ පැබ්ලෝවාදී සංශෝධනවාදීන්ගේ දේශපාලනය විසින් සූදානම් කරනු ලැබූ බව යි.''

දූර්බෝ ද ඔහුගේ බිරිඳ වූ ජරනා ද ඔහුගේ දූවරුන් ද කට්වා නගරයට පැමිනෙන සහෝදරවරුන්ට නවාතැන් හා ආහාරපාන ආදියෙන් සත්කාර කිරීමට සැමවිටම ආශා කලහ. ඔහුගේ දේශපාලන දැනුම සහ කැපවීම හේතු කොටගෙන දූර්බෝ කට්වා ප්‍රදේශය තුල ගෞරවාදරයට පත්ව සිටියහ.

2001 වසරේ දී, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කලින් සඳහන් කල දුලාල් බෝස්ගේ අභාවය නිමිත්තෙන් සටහනක් තබද්දී ප්‍රකාශ කල අයුරු ඔහුගේ ද 1990 ගනන් මුල හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවට එක් වූ සෙසු වියපත් පරිනත බීඑල්පීඅයි සාමාජිකයන්ගේ ද ජීවිත මගින්, පශ්චාත් යුද්ධ කාල පරිච්ඡේදයේ දී ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය මුහුන දුන් දේශපාලන දුෂ්කරතා පමනක් නො ව ඉන්දියානු කම්කරු පන්තිය තුල එය ඇති කර තිබූ ගැඹුරු මුල් ද පිලිබිඹු විය.

දූර්බෝගේ අධිෂ්ඨානවත් බවෙන් ද ආත්ම ශක්තියෙන් ද කම්කරු පන්තියේ විමුක්තිය ගැන ඔහුට තිබූ අචල විශ්වාසයෙන් ද ඉන්දියාවේ විප්ලවවාදී කම්කරුවන්ගේ, තරුනයින්ගේ සහ බුද්ධිමතුන්ගේ නව පරම්පරාවක් ශක්තිය උකහා ගනු ඇත. එහෙත් අන් සියල්ලට මත් වඩා ඔහුගේ ජීවිතයේ නොයෙකුත් විවිධ

සිදුවීම්වලින් ඔවුන් උගත යුතු යැයි ඔහු බලාපොරොත්තු වන්නේ, ඔහුටත් ඔහුගේ පරම්පරාවටත් ඉමහත් වියදමක් දරා උගෙන ගැනීමට සිදු වූ දේශපාලන පාඩම් යඃ එනම්, කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය සඳහා කෙරෙන දීර්ඝකාලීන අරගලය තුල කෙටි මාවත් නොමැතඃ එහි උපායන් ලෝක විප්ලවවාදී මූලෝපායකින් ගලා ආ යුතු අතර ඊට යටත් විය යුතු ය; මාක්ස්වාදියා කම්කරු පන්තියේ දේශපාලන පැහැදිලිකමේ වියදමෙන් ලබා ගන්නා කෙටිකාලීන වාසිවලට වඩා තාවකාලික හුදකලාව ප්‍රිය කරයි. ඒ මක්නිසා ද යත්, කම්කරු පන්තිය විප්ලවවාදී බලවේගයක් බවට පරිවර්තනය කිරීම සිදු වන්නේ පන්තියක් ලෙස එහි ස්වාධීන ඓතිහාසික අවශ්‍යතා ප්‍රකාශයට පත් කරවන්නා වූ දේශපාලන පිලිවෙතක් සඳහා කෙරෙන අරගලයක් තුලින් බව ඔහු වටහා ගන්නා නිසා ය.

ඉන්දියාවේ සෝෂලිස්ට් ලේබර් ලීගය ද ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ද දෘෂබා ජෝති මජුම්දාර් සහෝදරයාගේ පවුලට සිය ගැඹුරුම ශෝකය පල කර සිටියි.

© www.wsws.org